# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1644 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
27 /10 /2024
පැය 1440

## මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.10.26 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 25 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී යතුරු පැදියකින් පලා යාමට උත්සාහ කර ඇති අතර, යතුරු පැදිය පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - බිබිල පොලිස් වසම.**

2024.10.26 වන දින රාත්‍රී කාලයේ බිබිල පොලිස් වසමේ බිබිල මහියංගණය මාර්ගයේ රඹර් වත්ත ප්‍රදේශයේදී බිබිල දෙස සිට මහියංගණය දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පස් කන්දක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එක් පුද්ගලයෙකු එම ස්ථානයේදීම මියගොස් ඇත. අනෙක් පුද්ගලයා තුවාල ලබා බිබිල රෝහලට ඇතුලත්ව ප්‍රතිකාර ලබමින් සිටී.

**මරණකරු වයස අවුරුදු 16 ක් වන බදුලුඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බිබිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බිබිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.**

2024.10.27 වන දින අළුයම් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර විලච්චිය මාර්ගයේ අක්කර 25 හන්දිය ආසන්නයේදී යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත. බරපතල තුවාල ලැබූ පසුපැදිකරු අනුරාධපුර රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙක්.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**